යම් පුවතක් වාර්තා කිරීමේදී, එම පුවත එක් පාර්ශවයක අදහස් මත පමණක් පාදක කර නොගනිමින්, ඊට අදාළ ප්‍රධාන පාර්ශවයන්ගේ හෝ අදහස් විමසා බලා, එම සියලු අදහස් පුවතට අන්තර්ගත කිරීමත්, යම් පාර්ශවයක් සම්බන්ධ කරගැනීමට උත්සාහ දරා නොහැකි වුණි නම් ඒ පිළිබඳවද සඳහන් කර දැක්වීමත් වඩාත් සමබර මාධ්‍යකරණයක් යැයි කිව හැක. එසේම, දැන දැන හෝ හිතාමතාම වාර්ගික/ආගමික අසමගියට හෝ ප්‍රචණ්ඩත්වයට අනුබල ලැබෙන ආකාරයේ වාර්තාකරණයන්ගෙන් වැළකීම ද යහපත් මාධ්‍යකරණය යැයි පැවසිය යුතුයි.

"අන්තවාදීගෙන් කුරුන්දි විහාරයට නැවතත් කෙනහිලි" යන සිරස්තලයෙන් යුතුව දිවයින ඉරිදා සංග්‍රහයේ (ජූනි 19, 2022) පළ වූ ලිපිය තුළ අඩංගු ඇතැම් කරුණු, ඉහත දැක්වූ ආකාරයේ ගැටළු සහගත මාධ්‍යකරණයකට නිදසුන් ලෙසින් දැක්විය හැක.

කුරුන්දි විහාරයේ සර්වඥ ධාතු තැන්පත් කිරීමේ කටයුත්ත උද්ඝෝෂණයක් හේතුවෙන් නතර කිරීම මෙම ලිපියට ප්‍රස්තුත වී තිබූ අතර, ලිපිය තුළ"උතුරේ පච්කාර දෙමළ මිනිසුන් පිරිසක්", "දෙමළ අන්තවාදීන් කිහිප දෙනෙකු" වැනි හැඳින්වීම් දක්නට ලැබිණි.

එසේම, "...දෙමළ ජාතික සන්ධානය සහ එම ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන් මේ සංරක්ෂණ ව්‍යාපෘතිය කඩාකප්පල් කිරීමට නොයෙක් අයුරින් බාධා කළා" යනුවෙන් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අදහස් දැක්වීම් ද මෙම ලිපිය තුළ දැක්වී තිබිණි.

ඔබ සිතනා ආකාරයට,

1) උද්ඝෝෂකයින්ගේ අරමුණ පිළිබඳ සමබර තොරතුරු දැක්වීමක් වෙනුවට, ඔවුන්ව "පච්කාර දෙමළ මිනිසුන්", "දෙමළ අන්තවාදීන්" ලෙසින් හැඳින්වීම, වාර්ගික/ආගමික අසමගියකට තුඩු නොදෙනු ඇතිද?

2) ඓතිහාසික උරුමයක් පිළිබඳව පවතින ගැටළුවක් සම්බන්ධයෙන් මෙවැනි ලිපියක් පළ කිරීමේදී, ලිපිය තුළ චෝදනාවට ලක්ව ඇති අදාළ අනෙකුත් පාර්ශවයන්ට පැවසීමට ඇති අදහස් ද ඊට එක් වූයේ නම්, මෙම ලිපිය මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල, වඩාත් සමබර හා පූර්ණ මාධ්‍යකරණයක් නොවන්නේ ද?

3) එසේ නොමැති නම්, මෙය ඒකපාර්ශ්වික වාර්තාකරණයක් නොවනු ඇතිද?

ඒක පාර්ශ්වික නොවන සමබර වාර්තාකරණයක් වෙනුවෙන් ඇප කැප වෙමු!